සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

23 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

Third Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

# දේශපාලන විද්‍යාව I

කාලය පැය දෙකයි
අමතර කියවීම් කාලය විනාඩි 10 යි.

- මෙම ප්‍රශ්න පත්‍රය A - B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, A කොටස බහුවරණ ප්‍රශ්න 30කින් හා B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුයි.
- එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

## A කොටස

- අංක 1 සිට 15 දක්වා ප්‍රශ්නවලට වඩාත්ම නිවැරදි පිළිතුර හෝ ගැලපෙන පිළිතුර තෝරන්න.

01. දේශපාලනය යනු ,
   1. මානව සමාජයේ පුද්ගල කණ්ඩායම්වල ගැටුම් නිර්මාණය කිරීමේ ක්‍රියාදාමයකි.
   2. අධිකාරි බලය භාවිතාකරමින් අගය කිරීම් බෙදා හැරීමේ අත්හිටුවන ක්‍රමවේදයකි.
   3. මැතිවරණවලට තරග කිරීම ප්‍රමුඛතම අරමුණ හා ක්‍රමවේදය වේ.
   4. රාජ්‍යයට පමණක් සීමා නොවී රාජ්‍යයෙන් බාහිරවද පුරවැසියන් සහභාගිවන සමාජ භාවිතාවක් වේ.
   5. රාජ්‍ය පරිපාලනයට පමණක් සීමා වූ ක්‍රියාදාමයක් වේ. (.....)

02. පෞර රාජ්‍යයට සම්බන්ධ විෂය කාරණා පුළුල් පරාසයක පැතිර ගිය තේමා ගණනාවකින් යුක්තය. ඊට අදාල ප්‍රකාශය තෝරන්න.
   1. රාජ්‍යයේ ස්වභාවය, අරමුණු පාලන ක්‍රම, රාජ්‍යය සහ පුරවැසියා අතර සම්බන්ධතාවය ඉන් ප්‍රධාන තේමා කිහිපයකි.
   2. පුද්ගලයින්, දේශපාලනඥයින්, දේශපාලන පක්ෂ මෙහිදී ප්‍රමුඛ කොට සැලකේ.
   3. කාට කුමක්, කුමන අවස්ථාවක කෙසේ හිමිවන්නේද යන්න තීරණය කෙරෙන විෂය සංධාරය වේ.
   4. මිනිසුන් ලෞකික ජීවිතයෙන් මුදවා ගැනීමේ විෂය පථය වේ.
   5. මිනිස් ජීවිතයේ ආරම්භය, පැවැත්ම හා අවසානය අධ්‍යයනය කිරීම හා සම්බන්ධ වේ. (.....)

03. දේශපාලනය හැදෑරීම යන්නට,
   1. ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය පමණක් හැදෑරීම වේ.
   2. රාජ්‍යයේ බලය ලබාදීම සඳහා වන අරගලය පිළිබඳව පමණක් හැදෑරීම අයත් වේ.
   3. ඡන්දදායක සහ වෘත්තීය දේශපාලනඥයින්ගේ චර්යාව පමණක් ඊට අදාළ වේ.
   4. ආණ්ඩුකරණ ක්‍රියාවලියට ප්‍රායෝගිකව සහභාගිවීම අයත් වේ.
   5. පාලකයින්ගේ ගතිගුණ කුසලතා පාලන ක්‍රම ඊට අයත් වේ. (.....)

04. චර්යාවාදය,
   1. දේශපාලන ප්‍රපංච පිළිබඳව ගොඩනගන දැනුම සහ නිගමනවලට වටිනාකම් විනිශ්චයන් සපයා දෙයි.
   2. න්‍යාය ගොඩනැගැන්වීමට හා අධ්‍යයන විධික්‍රම වර්ධනය කිරීමට උපකාරීවෙයි.
   3. දේශපාලන විද්‍යාවේ එයටම ආවේණික න්‍යාය හා සංකල්ප තිබුණද අනෙකුත් විෂයන්ගේ න්‍යායන් හා බැඳී පවතී.
   4. 1970 න් පසු චර්යාවාදයේ වැදගත්කම යළි වර්ධනය වී අනෙකුත් සමාජ විද්‍යාත්මක ප්‍රවේශවල වැදගත්කම ඉහළගොස් ඇත.
   5. ප්‍රජාතන්ත්‍රවාදය සහ කුලසාධකය අතර සම්බන්ධය මැනවින් අවබෝධ කර ගැනීමට චර්යාවාදී ප්‍රවේශ විග්‍රහය අවශ්‍යයම වේ. (.....)

05. මාක්ස්වාදී අභාෂය ලැබූ දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශයේ ලක්ෂණ අයත් පැතිකඩක් වනුයේ,
   1. එමගින් පක්ෂනායක සම්මුඛ සාකච්ඡා පදනම් කොටගෙන විනිශ්චයන් තීරණය කරන බව පිළිගැනීම.
   2. දේශපාලන ආර්ථික හා සමාජ පන්ති යන සාධකවලින් තීරණය කරන බව පිළිගැනීම.
   3. දේශපාලන ක්ෂේත්‍රයෙන් ස්ත්‍රීන් බැහැර කර තිබීම පිළිගැනීම.
   4. දේශපාලන දාර්ශනිකයන්ගේ මානසික ක්‍රියාවලියක් බව තේරුම් ගැනීම
   5. සමාජ සැකැස්මේ උපරිම ව්‍යුහය ස්වාධීනව වර්ධනය වීම. (.....)

06. ලිබරල් දේශපාලන මතවාදය,
   1. පැසිස්ට්වාදයට විකල්පයක් ලෙස නිර්මාණය වූවකි.
   2. පෞද්ගලික නිදහස ප්‍රතික්ෂේප කිරීම උදෙසා ගොඩ නැගුණකි.
   3. ප්‍රජාතන්ත්‍රවාදය මුලිනුපුටා දැමීමට මතු වූවකි.
   4. මැතිවරණ ක්‍රමය ප්‍රධාන සාධයක් ලෙස පිළිනොගැනීමට ස්මතු වූවකි.
   5. යුරෝපා හා යුරෝපා නොවන රාජ්‍යවල බහුජන ව්‍යාපාරවලට මග පෙන්වූ ප්‍රබල මතවාදයක් විය. (.....)

07. පැසිස්ට්වාදී රාජ්‍යය,
   1. මෙහි ඇත්තේ කිසිදු සිවිල් හෝ දේශපාලන අයිතියක් නැති පුද්ගල සහභාගිත්වය අකර්මන්‍ය කළ දේශපාලනයකි.
   2. දෙවන ලෝක යුද්ධයෙන් පසු මෙම පැසිස්ට් රාජ්‍ය ආකෘතිය තවදුරටත් වර්ධනය විය.
   3. ජනතාව පාලකයා වන අතර රාජ්‍යය ද්විතියික වේ.
   4. මෙම මතවාදය විශේෂ රාජ්‍යය මාදිලියක් ලෙස ඩේවිට් හේල්ඩ් න්‍යායවේදියා විසින් ගොඩනගා ඇත.
   5. ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තන සාර්ථකව සිදුවූ රාජ්‍යය මාදිලියක් ලෙස දේශපාලන විචාරකයින්ගේ පැසසුමට ලක් වී තිබේ. (.....)

08. ඒකීය ආණ්ඩුක්‍රමය යනු,
   1. මධ්‍යම හා ප්‍රාන්ත ආණ්ඩු අතර ස්වාධිපත්‍ය බලය බෙදා හැරීමය.
   2. විවිධත්වය තුළින් ඒකීයත්වය ගොඩනැගීමය.
   3. රාජ්‍යයේ ස්වාධිපත්‍යය මුලුමනින්ම මධ්‍යම ආණ්ඩුව වෙත රඳා පවතින පාලන ක්‍රමයක්ය.
   4. හමුදා බලය යොදා කටයුතු කරන කාර්යක්ෂම පාලන ක්‍රමයක්ය.
   5. මහජනතාවගේ පෞද්ගලික අපේක්ෂාවන්ට මූලිකත්වය දෙන පාලන ක්‍රමයක්ය. (.....)

09. සන්ධීය ආන්ඩුක්‍රමයක විශේෂ ලක්ෂණයක් වන්නේ,
   1. ස්වාධිපත්‍යය බලය තනි ජාතික ආයතනයකට පවරා තිබීමය.
   2. ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් පැවතීම.
   3. එක් ජනවර්ගයක් හා එක් ආගමක් ප්‍රමුඛ කොට සැලකීමය.
   4. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී නියෝජනය තුලින් පාලකයන් පත්කිරීමය.
   5. බලය ක්‍රියාවට නැගීමේදී සංවරණ හා තුලන මූලධර්ම අනුගමනය කිරීමය. (.....)

10. රටක පීඩාකාරී පාලනයක් ඇතිවීම කෙරෙහි බලපානුයේ,
   1. බලතල බෙදා ක්‍රියාවට නැගීමය.
   2. ස්වාධින අධිකරණ ක්‍රමයක් පැවතීමය.
   3. ව්‍යවස්ථානු කුලවාදයට අනුව කටයුතු නොකිරීමය.
   4. ශක්තිමත් සිවිල් සමාජයක් පැවතීමය.
   5. මහජන අදහස් ඉල්ලීම් කෙරෙහි අවධානය යොමුකර කටයුතු කිරීමය. (.....)

11. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයේ මූලික ලක්ෂණයකි.
   1. සංශෝධනය කළ හැක්කේ මණ්ඩල දෙකේ $\frac{2}{3}$ බහුතර ඡන්දයෙන් පමණි.
   2. මුළුමනින්ම ලියවුණු නීතිමය ලියවිල්ලක් වීම.
   3. උසාවිවලට අධිකරණ විවරණ බලය පවරා තිබීම.
   4. විධායකය ලෙස පාර්ලිමේන්තුවේ දෙවන මණ්ඩලය කටයුතු කිරීම.
   5. පාර්ලිමේන්තු පරමාධිපත්‍ය සහිත ආණ්ඩුක්‍රමයක් වීම. (.....)

12. ඇමරිකානු ආණ්ඩුක්‍රමය,
   1. බලතල බෙදීමේ න්‍යාය ව්‍යස්ථාවෙන් පිළිගෙන නැත.
   2. ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයකින් යුක්තවේ.
   3. ලේඛනගත සන්ධීය ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක වේ.
   4. විධායකය ප්‍රධාන වන අතර නිලකාලය වසර 6 කි.
   5. ජනතාව විසින් ඍජුවම ජනාධිපති තෝරාගනු ලබයි. (.....)

13. 1931 ඩොනොමෝර් ප්‍රතිසංස්කරණයට අදාල ප්‍රකාශය තෝරන්න.
1. බ්‍රිතාන්‍යයන් විසින් මෙරටට හඳුන්වා දුන් අවසාන ප්‍රතිසංස්කරණය වීම.
2. දේශපාලන ගමන්මගෙහි කේන්ද්‍රස්ථානය වීම.
3. බ්‍රිතාන්‍ය යටත් විජිතයක් ලෙස තවදුරටත් ලංකාව තබා නොගැනීම.
4. මේ වන විට සංවිධානය වූ දේශපාලන පක්ෂ ක්‍රමයක් ලංකාවේ තිබීම.
5. ලංකාවට කැබිනට් ආණ්ඩුක්‍රමයක් ස්ථාපනය කිරීමට එකඟවීම. (.....)

14. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමයේ මූලික ලක්ෂණ අතරට ගැනෙන්නේ,
1. ව්‍යවස්ථාදායකය හා විධායකය අතර දුරස්ථ සම්බන්ධතාවය.
2. පූර්ණ බලැති විධායකයක ක්‍රියාකාරිත්වය.
3. ව්‍යවස්ථාදායකය හා විධායකය වෙන් වෙන් මැතිවරණ තුලින් පත්වීම.
4. දේශපාලන විධායකයට අගමැති නායකත්වය දීම.
5. සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් පමණක් ව්‍යවස්ථාදායකය නිර්මාණය වීම. (.....)

15. සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ගෙන ඇති විධිවිධානයකි.
1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය පිහිටුවීම.
2. 29 - 2 වගන්තිය හඳුන්වාදීම.
3. මූලික අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාගත කිරීම.
4. බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාස ක්‍රමය අහෝසි කිරීම.
5. උත්තරීතර පාර්ලිමේන්තුවක් නිර්මාණය කිරීම. (.....)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුලත් වරණය තෝරන්න.**

16. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ස්වාභාවය තීරණය කිරීම සඳහා බලපාන්නාවූ සාධක වලට අදාල ප්‍රකාශ කාණ්ඩය වනුයේ,
A සමාජ සංස්කෘතික සාධක
B පාලන තන්ත්‍රයේ දේශපාලන අභිලාෂ
C ජන සමාජයේ පොදු අපේක්ෂා සහ අධිපති දෘෂ්ටීන්
D ගෝලීය ත්‍රස්තවාදයේ උන්නතිය උදෙසා ගනු ලබන ක්‍රියා කලාපයන්
E කලාපීය හා ජාත්‍යන්තර බල තුලනය.
1. ABCD 2. BCDE 3. ACDE 4. ABCE 5. ABDE (.....)

17. ඉන්දීය ආණ්ඩුක්‍රමයේ මූලික ලක්ෂණ අයත් කාණ්ඩය වන්නේ,
A ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක ක්‍රියාකාරීත්වය
B බහු පක්ෂ ක්‍රමයේ පැවතීම
C අධිකරණය උත්තරීතර නොවීම
D මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම
E ඒකීය පුරවැසිභාවය
1. ABCD 2. BCDE 3. ACDE 4. ABDE 5. ABCE (.....)

18. රටකට ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය වන්නේ,
A දේශපාලන ස්ථාවරභාවය පවත්වාගෙන යාම සඳහා
B ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂාකර ගැනීම සඳහා
C ඒකාධිපති ක්‍රමයක් ඇතිවීම වැලැක්වීම සඳහා
D පැහැදිලි දේශපාලන ආර්ථික දර්ශනයක් සපයා ගැනීම සඳහා
E මිනිස් අයිතිවාසිකම් යටපත් කිරීම සඳහා
1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5. ABCE (.....)

19. දීර්ඝකාලීන ප්‍රචණ්ඩ ගැටුම් පැවති සමාජවල සාධනීය සාමය ගොඩනැගීමට ප්‍රතිසන්ධාන ගතවීම මට්ටම් කිහිපයකින් සිදුවේ. ඊට අදාල ප්‍රකාශ අන්තර්ගත වන්නේ,

A මනෝවිද්‍යාත්මක ක්‍රියාමාර්ග

B හවුලේ ක්‍රියාත්මක කිරීමට එකඟවන කරුණු පෙන්වාදීම.

C ගැටුම් පාර්ශව අතර පණිවිඩකරුවකු ලෙස ක්‍රියා කිරීම.

D සමාජීය ක්‍රියාමාර්ග

E දේශපාලන ක්‍රියාමාර්ග.

1. ABC 2. BCD 3. CDE 4. ADE 5. BDE (.....)

20. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ සමකාලීන ප්‍රවණතා අතරට ගැනෙන්නේ,

A චීනය සමඟ ආර්ථික සබඳතා නැවත ශක්තිමත් වීම.

B විදේශීය මූල්‍ය සංවිධාන සමඟ ඉතා සමීප හා ඍජු සම්බන්ධතාවයක් පැවත්වීම.

C 2015 සිට ක්‍රියාත්මක වන එක්සත් ජාතික පක්ෂය වටා ගොඩනැගුණු පාලන තන්ත්‍රය ''බටහිරට නම්‍යශීලී'' විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.

D නොබැඳි ප්‍රතිපත්තිය නව පාලනතන්ත්‍රයේ විදේශ ප්‍රතිපත්තිය වීම.

E ෆේස්බුක් සමාජ ජාලය ආශ්‍රිතව ගොඩනැගුණු මහජන ව්‍යාපාරයන් බලවත්වීම.

1. ABC 2. BCD 3. CDE 4. ADE 5. BDE (.....)

- **අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුලත් වරණය තෝරන්න.**

21. 1978 ව්‍යවස්ථාවට කරන ලද 19 වන සංශෝදනය යටතේ,

A ජනාධිපතිගේ ධූර කාලය අවු. 6 සිට අවු. 5 දක්වා අඩු කළේය.

B ජනාධිපතිධූර අපේක්ෂකයෙකුගේ අවම වයස් සීමාව අවු. 30 සිට 35 දක්වා වැඩි කළේය.

C එක් පුද්ගලයෙකුට ජනාධිපති ධූරය දැරිය හැක්කේ දෙවතාවකි යන කොන්දේසිය නැවත පැනවීමය.

D පාර්ලිමේන්තුව ප්‍රතික්ෂේප කළ ව්‍යවස්ථාමය නොවන පනත් කෙටුම්පතක් ජනමත විචාරණයට ලක් කළ හැක.

E ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගරු කරමින් එය පිළිපදින බවට සහතික වීම ජනාධිපතිගේ වගකීමක් බවට පත් කළේය.

1. ABC 2. ABD 3. BCDE 4. ABCE 5. ABCD (.....)

22. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (19 වන සංශෝධනයට පෙර)

A ශ්‍රී ලංකාවේ ''ගෝලිස්ට් ව්‍යවස්ථාව'' ලෙස හඳුන්වනු ලැබේ.

B ව්‍යවස්ථානුකූල ඒකාධිපතිත්වයක් ගොඩනැගීමට දායකවී ඇත.

C අගමැති තනතුර දැඩි ලෙස අවප්‍රමාණය කර ඇත.

D රටතුළ යහපාලනය ගොඩනැගීමට විශාල වශයෙන් දායක වී ඇත.

E ශ්‍රී ලංකා රාජ්‍යයේ අනාගාමික ස්වරූපය වෙනස් කළේය.

1. ABC 2. ABD 3. BCDE 4. ABCD 5. BCDE (.....)

23. සෝල්බරි ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකය,

A ද්වි මාණ්ඩලික විය

B නාමකරණයෙන් හා ජනතා ඡන්දයෙන් නියෝජිතයන් පත්විය.

C ව්‍යවස්ථා සම්පාදනය උත්තරීතර විය.

D ජාතික රාජ්‍ය සභාව යන නිල නාමයෙන් හැඳින්විය.

E මණ්ඩල දෙකේ නිල කාලය සමාන විය.

1. A හා B 2. A හා D 3. B හා C 4. B හා E 5.A,C,D හා E (.....)

24. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව,
A සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දෙන ලදි.
B කැබිනට් ආණ්ඩුක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.
C රාජ්‍ය සේවය දේශපාලන විධායකයට යටත් කරන ලදි.
D බ්‍රිතාන්‍ය රැජින රාජ්‍ය නායිකාව ලෙස තබාගන්නා ලදී.
E විධායකයට යටත් ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කරන ලදී.
1. A හා B 2. B හා C 3. C හා D 4. AB හා E 5.A,C,D හා E (.....)

25. 1978 ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම්,
A මූලික අයිතිවාසිකම් ජනතා පරමාධිපත්‍යයේ කොටසක් ලෙස පිළිගෙන ඇත.
B 1978 ව්‍යවස්ථාවේ සඳහන් අයිතිවාසිකම් 1972 ව්‍යවස්ථාවේ අයිතිවාසිකම් වලට වඩා පුළුල් ලෙස සකස් කර ඇත.
C ශ්‍රේෂ්ඨාධිකරණය මූලික අයිතිවාසිකම් වල ආරක්ෂකයා විය.
D මූලික අයිතිවාසිකම් කඩවීමකදී සහන පතා ඕනෑම අධිකරණයකට පෙත්සමක් ඉදිරිපත් කළ හැක.
E මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ඇතිකරන ලද යාන්ත්‍රණයට ඔම්බුඩ්ස්මන් ධූරයද අයත් වේ.
1. A හා B 2. B හා C 3. C හා D 4. ABC හා E 5.BCD හා E (.....)

- **26 සිට 30 දක්වා ඇති සෑම ප්‍රශ්නයක් සඳහාම ප්‍රකාශ දෙකක් අඩංගු කර ඇත. එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහතින් දක්වා ඇති හැඳින්වීම් වලින් කවරක්ද යන්න තෝරා 1, 2, 3, 4,5 ලෙස ඒවා නම් කරන්න.**

| අංකය | ප්‍රකාශ I | ප්‍රකාශ II |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍යය |
| 2 | සත්‍යය | අසත්‍යය |
| 3 | අසත්‍යය | සත්‍යය |
| 4 | අසත්‍යය | අසත්‍යය |
| 5 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | ප්‍රකාශය I | ප්‍රකාශය II | |
|---|---|---|---|
| 26 | 1972 I ජනරජ ව්‍යවස්ථාව යටතේ ස්වාධීන රාජ්‍ය සේවා සංකල්පය අහෝසි කොට දේශපාලන විධායකයට යටත් කරන ලදී. | රාජ්‍ය නිලධාරින් පත්කිරීම, මාරුකිරීම හා අස්කිරීම් සිදු කිරීමේදී අමාත්‍ය මණ්ඩලයට සහායවීමට කොමිෂන් සභා පත්කළද එම කොමිෂන් සභා උපදෙස් නොතකා ස්ව අභිමතය පරිදි කටයුතු කළ හැකිවීම. | (.....) |
| 27 | 1978 ව්‍යවස්ථාව යටතේ ඇති කළ ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුව නීති සම්පාදනයේදී ස්වාධිපති ආයතනයක් විය. | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූල භාවය පරීක්ෂා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට බලය තිබූ අතර, පාර්ලිමේන්තුවට අමතරව ජනමත විචාරනයකින්ද නීති පැනවීමට බලය තිබුණි | (.....) |
| 28 | 19 වැනි ව්‍යවස්ථා සංශෝදනය යටතේ ලංකාවේ ආණ්ඩු ආයතන පද්ධතියට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නම් ආයතනය ඇතිකරන ලදි. | එහි සංයුතිය සාමාජිකයන් 10 වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ප්‍රධානියා වන්නේ කථානායක වරයාය. | (.....) |
| 29 | 1987 ඉන්දු ලංකා ගිවිසුමෙ සෘජු ප්‍රතිඵලයක් හැටියට පළාත් සභා ක්‍රමය ඇති කිරීමෙන් විධායක ජනාධිපතිගේ බලය සංවරණය කරන ලදී | පළාත් සභාවේ ආණ්ඩුකාර ධූරය සෘජු මහජන ඡන්දයෙන් තෝරා ගනී. | (.....) |
| 30 | ව්‍යවස්ථානුකූලවාදය යනු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් මත රාජ්‍ය පාලනය ගොඩනගා තිබීමය. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නොමැතිව වුවද ව්‍යවස්ථානුකූලවාදය පැවතිය හැක. | (.....) |

## B කොටස

31. දේශපාලනය යනු පොර රාජ්‍යයට සම්බන්ධ කාරණයක්ය යන ග්‍රීක අදහසේ අර්ථ දෙකක් තිබේ. ඒවා නම් කරන්න.?

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

32. දේශපාලන සංසිද්ධි හා රාජ්‍යය ප්‍රතිපත්ති හැඩගස්වනු ලබන ප්‍රධාන මතවාද දෙකක් ලියන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

33. පහත කෘති රචනා කළ දේශපාලන චින්තකයින් නම් කරන්න.

(i) පොලිටික්ස් (Polititics) - ..........................................................................................

(ii) මගේ සටන (Mein Kumpf) - ..........................................................................................

34. පහත මූලික ලක්ෂණ දැකිය හැකි රාජ්‍යය ක්‍රම දෙක නම් කරන්න?

(i) රාජ්‍යය හා පෞද්ගලික දේපල යන දෙකම යෙදාවා ගත් දැඩි පාලිත අර්ථ ක්‍රමය

(ii) ආර්ථික හා සමාජ කටයුතු කළමනාකරණය කරමින් සමාජයේ පීඩනයට පත් කොටස්වල භෞතික වර්ධනය උදසො කටයුතු කිරීම.

(i) ..........................................................................................................................................

(ii) ..........................................................................................................................................

35. දේශපාලන විද්‍යාව විෂයයක් ලෙස අධ්‍යයනය කිරීම ආරම්භ කිරීමට පදනම දැමූ දාර්ශනිකයින් දෙදෙනෙක් නම් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

36. විවිධාකාර ආශාවන් හා අවශ්‍යතාවන්ගෙන් යුක්ත ඡන්දදායකයින් පොදු අරමුණක් සඳහා එකට එක්තැන් කිරීම හැඳින්විය හැකි නාමය කුමක්ද? එහි එක් වර්ග කිරීමක් සඳහන් කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

37. ආණ්ඩුව සිය බලය ක්‍රියාවට නගන ආයතන දෙකක් දක්වන්න?

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

38. තුලනාත්මක ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ධාරා තුනකි. එයින් දෙකක් පෙන්වා දෙන්න?

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

39. ඒකීය රාජ්‍යයන්හි පරිපාලන බලය බෙදා හැරීමේ ප්‍රධාන ආකාර දෙකක් දක්වන්න.

1. ....................................................................................................................................................

2. ....................................................................................................................................................

40. ස්වාධිපත්‍යය බලය බෙදා ගෙන ක්‍රියාත්මක කරනු ලබන බහු මට්ටමේ පාලන ආකෘතිය හඳුන්වන්නේ කිනම් නාමයකින්ද? එවැනි පාලන ක්‍රමයක් ක්‍රියාත්මක වන රාජ්‍යයක් නම් කරන්න.

........................................................................................................................................................

........................................................................................................................................................

41. 1927 පත්කළ ඩොනමෝර් කොමිසමේ සභාපතිවූයේ කවුරුන්ද? එම ආණ්ඩුක්‍රමය යටතේ ව්‍යවස්ථාදායකය හැඳින්වූයේ කිනම් නාමයකින්ද?

........................................................................................................................................................

........................................................................................................................................................

42. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ පාර්ලිමේන්තුව ආයතන තුනකින් සමන්විත විය. එයින් දෙකක් සඳහන් කරන්න.

1. ....................................................................................................................................................

2. ....................................................................................................................................................

43. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ වූ නාමික හා දේශපාලන විධායකය නම් කරන්න.

........................................................................................................................................................

44. සාමූහික වගකීම පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක සාර්ථක අසාර්ථක භාවය මැන බලන මිනුම් ඒකකයක් ලෙස සැලකේ. සාර්ථක සාමූහික වගකීමක් සඳහා තිබිය යුතු මූලික සාධක දෙකක් දක්වන්න.

1. ....................................................................................................................................................

2. ....................................................................................................................................................

45. දේශපාලන ප්‍රචන්ඩත්වය යන මාතෘකාව නූතන දේශපාලන සමාජයන්හිදී සාකච්ඡා වන මාතෘකාවක් වී තිබේ. නූතනයේ දේශපාලන ප්‍රචණ්ඩත්වයන් ඇතිවීම කෙරෙහි බලපාන සාධාක දෙකේ පෙන්වා දෙන්න?

1. ....................................................................................................................................................

2. ....................................................................................................................................................

46. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ පනත් සහතික කිරීමේ බලය හිමිවූ පුද්ගලයන් දෙදෙනෙක් සඳහන් කරන්න?

1. ....................................................................................................................................................

2. ....................................................................................................................................................

47. ශ්‍රී ලංකාවේ ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයන් ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම දෙකක් නම් කරන්න?

1. ....................................................................................................................................................

2. ....................................................................................................................................................

48. (i) පාර්ලිමේන්තු සභාව පිහිටුවන ලද්දේ කිනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝදනය යටතේද?

(ii) ජනාධිපති සතු අසීමිත බලතල සංවරණය කිරීම සඳහා විධිවිධාන ගෙනන ලද්දේ කිනම් සංශෝධනයෙන්ද?

(i) ..............................................................................................................................................

(ii) ..............................................................................................................................................

49. (i) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමය තුළ නිතර අවධානය යොමු නොවන ඒහෙත් ඒ සම්බන්ධ වැදගත් ආයතනයකි. එය කුමක්ද?

..........................................................................................................................................

(ii) දේශපාලන න්‍යායයට අනුව රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැන්වීම සම්බන්ධයෙන් නිසි බලධාරි ආයතනය කුමක්ද?

..........................................................................................................................................

50. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය රදා පවතින මූලධර්ම දෙක නම්කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

23 | S | II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 13 - 2019**

විභාග අංකය .............................   දේශපාලන විද්‍යාව II   කාලය පැය තුනයි

**සැලකිය යුතුයි :**

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත වේ.**
- **පළමුවැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක්ද,**
- **දෙවැනි කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙකක්ද,**
- **තුන්වැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක්ද වන සේ තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

## I කොටස

01. පහත ඒවා විමසන්න.
    (i) දේශපාලනය
    (ii) දේශපාලන විද්‍යාව (10 x 2 = 20)

02. පහත අධ්‍යයන ප්‍රවේශවලින් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.
    (i) දාර්ශනික ප්‍රවේශය   (ii) තුලනාත්මක ප්‍රවේශය
    (iii) චර්යාවාදි ප්‍රවේශය   (iv) ස්ත්‍රිවාදී ප්‍රවේශය (10 x 2 = 20)

03. පහත මාතෘකා වලින් ඕනෑම **දෙකක්** සාකච්ඡා කරන්න.
    (i) නිරාගමික වාදය
    (ii) ස්ත්‍රීවාදය
    (iii) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය හා ජනාධිපති ආණ්ඩුක්‍රමය
    (iv) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය හා එහි ලක්‍ෂණ (10 x 2 = 20)

## II කොටස

04. ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනය තුළ ඇත් වූ පහත මාතෘකා වලින් 2 ක් විස්තර කරන්න.
    (i) යටත් විජිත පරිවර්තනය තුළ ඇති වූ දේශපාලන පරිවර්තන
    (ii) යටත් විජිත වරිපර්තනය තුළ ඇති වූ ආර්ථික හා සමාජ පරිවර්තනය
    (iii) සර්වජන ඡන්ද බලය හඳුන්වා දීම (10 x 2 = 20)

05. 1947 සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තුව හා 1972 ප්‍රථම ජන රජ ව්‍යවස්ථාව යටත් පිහිටුවන ලද ජාතික රාජ්‍ය සභාව සතු ව්‍යවස්ථාදායක බලතල සංසන්දනය කරන්න. (ලකුණු 20)

06. පහත මාතෘකාවලින් 2 ක් විමසන්න.
    (i) සමානුපාතික නියෝජන ක්‍රමයේ වාසි අවාසි
    (ii) අධිකරණයේ ස්වාධීනත්වය
    (iii) සෝල්බරි ව්‍යවස්ථාව යටතේ සුලු ජන අයිතීන් සුරක්ෂිත කිරීමට යෙදූ විධිවිධාන
    (iv) 13 වැනි සංශෝධනය
    (v) 1978 ව්‍යවස්ථාදායකය (10 x 2 = 20)

07. 1978 II වන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 හා 19 සංශෝදන යටතේ ජනාධිපතිගේ තත්ත්වය, බලතල කාර්යයන් විස්තර කරන්න. (ලකුණු 20)

## III කොටස

08. පහත මාතෘකාවලින් 2 ක් විමසන්න.
   (i) ඇමරිකානු මධ්‍යම ආණ්ඩුවේ බලතල
   (ii) ඉන්දියානු ෆෙඩරල් ක්‍රමයේ විශේෂ ලක්‍ෂණ
   (iii) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයේ ආයතනික ව්‍යුහය හා නව ප්‍රවණතා (10x 2= 20)

09. ගැටුමක් යනු කුමක්දැයි හඳුන්වා ගැටුම් සමථන මාධ්‍යයන් පැහැදිලි කරන්න (ලකුණු 20)

10. පහත මාතෘකා වලින් 2කට කෙටි සටහන් ලියන්න.
   (i) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හා මෑත කාලීන ප්‍රවණතා
   (ii) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්‍ෂ ක්‍රමය හා මෑත කාලීන ප්‍රවනතා
   (iii) රාජ්‍ය ප්‍රතිපත්ති හඳුන්වා එහි අවධි දක්වන්න.
   (iv) අන්තර් ජාතික දේශපාලනය තුළ රාජ්‍ය නොවන ක්‍රියාධරයන් (10 x 2 = 20)

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019 - දේශපාලන විද්‍යාව

**පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | |
|---|---|---|
| (01) - 4 | (11) - 5 | (21) - 4 |
| (02) - 1 | (12) - 3 | (22) - 1 |
| (03) - 4 | (13) - 2 | (23) - 1 |
| (04) - 2 | (14) - 4 | (24) - 2 |
| (05) - 2 | (15) - 2 | (25) - 4 |
| (06) - 5 | (16) - 4 | (26) - 5 |
| (07) - 2 | (17) - 4 | (27) - 3 |
| (08) - 3 | (18) - 1 | (28) - 1 |
| (09) - 5 | (19) - 4 | (29) - 4 |
| (10) - 3 | (20) - 1 | (30) - 2 |

## B කොටස

31. 1. රාජ්‍ය හා රාජ්‍ය පාලනය සම්බන්ධ කාරණා
    2. රාජ්‍ය කටයුතු සම්බන්ධ පුරවැසියන්ගේ කාර්යභාරය හා ක්‍රියාකාරිත්වය
32. 1. ලිබරල්වාදය
    2. සමාජවාදය, ප්‍රජාතන්ත්‍රවාදය, සමූහාණ්ඩුවාදය, සුභසාධකවාදය, ජාතිකවාදය, ස්ත්‍රීවාදය හා මතවාද වලින් දෙකක්.
33. (i) පොලිටික්ස් (Polititics) - ඇරිස්ටෝටල්
    (ii) මගේ සටන (Mein Kumpf) - ඇඩොල්ෆ් හිට්ලර්
34. (i) පැසිස්ට් රාජ්‍යය (ii) සුබ සාධක රාජ්‍යය

35. 1.ප්ලේටෝ 2.ඇරිස්ටෝටල්
36. දේශපාලන පක්ෂ 2 ඒකපක්ෂ, ද්විපක්ෂ, බහු පක්ෂ යන වර්ග කිරීම් වලින් දෙකක්
37. 1. ව්‍යවස්ථාදායකය 2. විධායකය 3. අධිකරණය යන ආයතන වලින් දෙකක්.
38. 1. සම්භාව්‍ය තුලනාත්මක අධ්‍යයනය ප්‍රවේශය
    2. 20 වන ශත වර්ෂයේ තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශය
    3. සමකාලීන තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශය
39. 1. බලය විතැන් කිරීම 2.පරිපාලනය විමධ්‍යගත කිරීම 3. බලය පැවරීම යන කරුණු වලින් දෙකක්.
40. 1. සන්ධීය ආණ්ඩුක්‍රමය 2 ඇමරිකා එක්සත් ජනපදය, ස්විස්ටර්ලන්තය වැනි රාජයයන්
41. 1. ඩොනමෝර් සාමිවරයා 2. රාජ්‍ය මන්ත්‍රණ සභාව නමින්
42. 1. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය 2. සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය 3. ආණ්ඩුකරු මින් දෙකක්.
43. නාමික විධායකය - අග්‍රාණ්ඩුකාරවරයා
    දේශපාලන විධායකය - අගමැතිවරයා
44. 1. කැබිනට් මණ්ඩලය ප්‍රමාණයෙන් කුඩාවීම 2. කැබිනට් මණ්ඩලයේ සංයුතිය සමානවීම
    3. අගමැතිගේ පෞරුෂය
45. 1. පැහැර ගැනීම්, කැරලිකෝලාහල 2. විප්ලව, හමුදාව විසින් බලයෙන් පැහැරගෙන යාම
    3. ත්‍රස්තවාදය 4. ආගමික විප්ලව අවස්ථා 5. වර්ගවාදය 6. සම්ප්‍රදායික යුද්ධ යන මේවායින් දෙකක්.
46. 1. ජනාධිපතිවරයා 2. අග්‍රවිනිශ්චයකාරවරයා 3. නීතිපතිවරයා 4. අගමැතිවරයා
47. 1. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය 2. 1978 ආණ්ඩුක්‍රමය
48. (i) 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය (ii) 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය
49. (i) අධිකරණය (ii) දේශපාලන විධායකය
50. 1. මහජන කැමැත්ත 2. ප්‍රජාතන්ත්‍රභාවය

## තෙවන වාර පරීක්ෂණය II පත්‍රය - 13 ශ්‍රේණිය

## I කොටස

01. (i) දේශපාලනය හැඳින්වීම හා එහි ශාස්ත්‍රීය හැඳින්වීමද දක්වා දේශපාලනයේ ප්‍රධාන අර්ථ 2 ක විග්‍රහ කර තිබිය යුතුය. මේ යටතේ,
1. රාජ්‍යය, රාජ්‍ය පරිපාලනය හා ආණ්ඩුකාරණය යටතේ තේරුම් ගැනීම
2. සමාජ භාවිතයක් ලෙස තේරුම් ගැනීම ලියා තිබිය යුතුය
(ii) දේශපාලන විද්‍යාව හඳුන්වා දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම හා එහි තේමාවන් කෙටියෙන් දක්වා තිබිය යුතුය. (10 x 2 = 20)

02. දී ඇති අධ්‍යයන ප්‍රවේශවල හැඳින්වීම ඒ ප්‍රවේශ යොදාගත් චින්තකයන්, එම අධ්‍යයන ප්‍රවේශ වල යහපත් අයහපත් ලක්ෂණ ලියා තිබිය යුතුය. (10 x 2 = 20)

03. (i) **නිරාගමික වාදය** - මතවාදයක් ලෙස හැඳින්වීම
- ලිබරල් නිරාගමිකවාදය - සමාජවාදි නිරාගමිකවාදය - ඉන්දියානු නිරාගමිකවාදය - නිරාගමික වාදය හා දේශපාලනයේ වර්තමාන වැදගත්කම දක්වා තිබීම අපේක්ෂා කරයි.
(ii) **ස්ත්‍රීවාදය** - හඳුන්වා ස්ත්‍රීවාදි ව්‍යාපාරයේ ධාරාවන් 5,
- ලිබරල් ස්ත්‍රීවාදය - සමාජවාදී ස්ත්‍රීවාදය - රැඩිකල් ස්ත්‍රීවාදය - පශ්චාත් නූතන ස්ත්‍රීවාදය
- පශ්චාත් යටත් විජිත ස්ත්‍රීවාදය දැක්වීම අපේක්ෂා කරයි.
(iii) **පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය හා ජනාධිපති ආණ්ඩුක්‍රමය** - හඳුන්වා එහි ලක්ෂණ කෙටියෙන් දක්වා ඒ ආණ්ඩු මාදිලි දෙකේ වෙනස දක්වා තිබීම අපේක්ෂා කරයි.
(iv) **ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය හා එහි ලක්ෂණ** - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය හැඳින්වීම හා එහි ලක්ෂණ
- ව්‍යවස්ථානුකූලවාදය - මහජන පරමාධිපත්‍ය - බලතල බෙදීම - සංවරණ තුලන කම
- නීතියේ ආධිපත්‍ය - මානව අයිතිවාසිකම් - සීමිත ආණ්ඩුව ආදී ලක්ෂණ කෙටියෙන් විස්තර කර තිබිය යුතුය. (10 x 2 = 20)

## II කොටස

04. (i) හා (ii) යටත් විජිත රාජ්‍යයක් යනු හඳුන්වා ශ්‍රී ලංකාව යටත් විජිතයක් වීම හා ඒ යටත් විජිත පරිවර්තන තුල ඇති වූ ආර්ථික සමාජ දේශපාලන පරිවර්තන දක්වා තිබිය යුතුය.
(iii) සර්වජන ඡන්ද බලය යනු කුමක්දැයි දක්වා සර්වජන ඡන්දබලය ප්‍රධානය කිරීමට බලපෑ හේතු දක්වා සමාජ ආර්ථික දේශපාලන ප්‍රතිපල දක්වා තිබිය යුතු අතර, අයහපත් ලක්ෂණ ද ලියා ඇත්නම් වැඩි ලකුණු දෙන්න. (10 x 2 = 20)

05. 1947 සෝල්බරි ක්‍රමය යටතේ හා 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය එහි සංයුතිය නිලකාලය දක්වා එම ව්‍යවස්ථාදායකයන් දෙකින් ව්‍යවස්ථාදායක බලතල සංසන්දනය කර එහි පරමාධිපත්‍ය බලය දැක්විය යුතුය. (ලකුණු 20)

06. (i) සමානුපාතික ක්‍රමය හඳුන්වා එහි ලක්ෂණ කෙටියෙන් දක්වා වාසි අවාසි ලියන්න.
(ii) 1978 ව්‍යවස්ථාව යටතේ අධිකරණයේ ස්වාධිනත්වයට අදාල විධි විධාන දක්වා ඒවායේ ප්‍රායෝගික බව දක්වා තිබිය යුතුය.
(iii) සෝල්බරි ව්‍යවස්ථාව යටතේ යොදා ඇති සුළු ජන රැකවරණයට යොදා තිබූ විධිවිධාන දක්වා ඒවා විවේචනාත්මකව ලියා තිබිය යුතුය.
(iv) 1978 ව්‍යවස්ථාවට කරන ලද 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ පසුබිම, එම සංශෝධනය යටතේ පළාත් සභා ක්‍රමය පිහිටුවීම, එය පිහිටුවීමේ අරමුණු, පළාත් සභාවල සංයුතිය, බලය බෙදීම හා ප්‍රායෝගිකත්වය කෙටියෙන් දක්වා තිබීම.
(v) 1978 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය හඳුන්වා සංයුතිය හා ව්‍යවස්ථාදායක බලතලද එහි සීමාවන් ද දක්වා තිබිය යුතුය (10 x 2 = 20)

07. 1978 ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපති ධූරයට අදාල තත්ත්වය බලතල හා කාර්යයන් 18 වැනි සංශෝධනයට අනුව හා 19 වැනි සංශෝධනයෙන් එම බලතල සම්බන්ධයෙන් සිදුකල වෙනස්කම් දක්වා තිබිය යුතුය. (ලකුණු 20)

## III කොටස

08. (i) - ඇමරිකානු ආණ්ඩුක්‍රමය තුළ මධ්‍යම ආණ්ඩුව සතු බලතල
- ෆෙඩරල් ව්‍යවස්ථාවේ උත්තරීතර බාවයට අදාල විධිවිධාන
- යුදමය තත්ත්ව සම්බන්ධ බලතල
- වෙළඳාම සම්බන්ධ බලතල
- බදු අය කිරීම හා වියදම් කිරීම පිළිබඳ බලතල

(ii) ඉන්දියානු ෆෙඩරල් ක්‍රමයේ විශේෂ ලක්ෂණ
- අර්ධ සන්ධීය බව
- මධ්‍යම ආණ්ඩුවේ ශක්තිමත් බව
- නම්‍ය භාවය
- නීති සම්පාදන සම්බන්ධතා
- මූල්‍ය සම්බන්ධතා

(iii) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයේ ආයතනික ව්‍යුහය
- පාර්ලිමේන්තුව
- කැබිනට් මණ්ඩලයේ නායකත්වය
- උසාවි
- කිරීටය
- සිවිල් සේවය
- බලය විමධ්‍යගත කිරීම

කෙටියෙන් දක්වා තිබීම (10x 2= 20)

09. ගැටුමක් යනු කුමක්දැයි හඳුනවා
- සහමන්ත්‍රණය
- මැදිහත් කරණය
- සාම ගිවිසුම
- සාමය ගොඩනැගීම යන කරුණු විස්තර කර තිබිය යුතුය (ලකුණු 20)

10. (i) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හඳුන්වා එහි මෑත කාලීන ප්‍රවනතා දක්වා තිබීම

(ii) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය හඳුන්වා අධිපති පක්ෂ දෙක දක්වා පක්ෂ ක්‍රමය තුළ දැකිය හැකි මෑත කාලීන ප්‍රවනතා ලියා තිබිය යුතුය.

(iii) රාජ්‍ය ප්‍රතිපත්ති හඳුන්වා එහි අවධි හෙවත් රාජ්‍ය ප්‍රතිපත්ති චක්‍රය කෙටියෙන් විස්තර කර තිබිය යුතුය.

(iv) ලෝක දේශපාලනය තුළ රාජ්‍ය නොවන ක්‍රියාධරයන් වන,
* රාජ්‍ය නොවන සංවිධාන
* බහු ජාතික සමාගම්
* කීර්තිමත් පුද්ගලයන්
* ත්‍රස්තවාදි සංවිධාන

ආදිය දක්වා තිබිය යුතුය. (10 x 2 = 20)